"මං ආයෙ එන්නෙ නෑ ජගත්.." ඔහු අවසන් වරට කීවේ ය. ".. මං නිසා ඔයාලටත් කරදර වෙයි.."

කිලිටු කමිසයෙන් හා කලිසමෙන් සැරසී පතුල් ගෙවී ගිය කබල් සපත්තු දෙක අද්දවමින් ඔහු අපේ නිවසේ සිට මහ පාර දෙසට ගාටමින් යන අයුරු ඇස්වල කඳුලු පුරවාගෙන මම ගේට්ටුව අසළ සිට බලා සිටියෙමි.

සිරිනිමල් අතුරුදන් වූ දහසක් තරුණයන් අතරට එක් විය.

# මගේ ලෝකය

## ඇසෙන දැනෙන දේ.. හිතට වැදෙන දේ..



ජගත් ජේ එදිරිසිංහ

ජීවිතය ගමනකි. බොහෝ ගැහුණු හා මිනිස්සු මේ ගමනේ දී අපට හමුවෙති. එහෙත් අපේ සිත තුළ රැඳෙන්නනට හැකි හෘදයාංග ම යමක් අපට දායාද කරදෙන්නෝ එයින් කීයෙන් කී දෙනෙක් ද? ආ මඟ දෙස ආපසු හැරී බලන විට මතකයට එන මගේ පැරණිම මිතුරා සිරිනිමල් ය. (ඔහු පිළිබඳව මෙයට පෙර ලිපියක යම් සඳහනක් කළා ඔබට මතක ඇතැයි මම සිතමි) ඔහු මට සමීප වන්නේ 'ළමා ලෝකය' සඟරාව හරහා ය.

මා එහි සංස්කාරකවරයා වන විට ඔහු සහය සංස්කාරකවරයා විය. සිරිනිමල් ඒ යුගයේදීත් දක්ෂ ලෙස ලිව්වේ ය. ඔහු ලියූ කවි මම මහත් සේ අගය කළෙමි. මා උඩහමුල්ල රජයේ බෞද්ධ කණිටු විදුහලෙන් ඉවත් වී කෝට්ටේ ශාන්ත තෝමස් විදුහලට ඇතුල් වූ පසුවද අපේ මිත්‍රත්වය එළෙසින්ම පැවතුණි. එයින් වසරකට පසුව මා කෝට්ටේ ආනන්ද ශාස්ත්‍රාලයයට ඇතුල් වූ අතර ඒ සමගාමීව සිරිනිමල් නුගේගොඩ ශාන්ත ජෝන් විද්‍යාලයයට ඇතුල් වූයේ ය.

විද්‍යා අධ්‍යාපනික පුවත්පතක් ආරම්භ කළ යුතු යයි යන අදහසක් අප දෙදෙනා තුළ ම විය. මා එවකට ගණිත අංශයෙන් ඉගෙනීම ලබමින් සිටි අතර ඔහු ජීව විද්‍යා අංශයෙන් ඉගෙනුම ලබමින් සිටියේ ය. අපි ''විද්‍යාව'' නමින් පුවත් පතක් ආරම්භ කළෙමු. එවකට ජනප්‍රිය පුවත්පතක් ව තිබූ සිත්තර පුවත්පතේ ප්‍රමාණයට සකස් වුණ අපේ පුවත් පත ඉතා සුලු ලාභයක් සහිතව වෙළඳ පොළට දමන්නට අපි තීරණය කර සිටියෙමු.

පුවත්පතට සම සංස්කාරකවරු සිව් දෙනෙක් වූහ. සිරිනිමල් හා මා හරුණ විට අනෙක් සංස්කාරකවරුන් වූයේ සුමිත් හා දයාවංශයි. සිරිනිමල් හා සුමිත් ඒ වන විට ජීව විද්‍යා අංශයෙන් බාහිර උපාධිය හදාරමින් සිටියහ. අපි මහත් වැර වෑයමකින් පුවත්පත ඉදිරියට ගෙන ගියෙමු.

සිරිනිමල් බරපතල කොමියුනිස්ට් විරෝධියෙක් විය. කොමියුනිස්ට් වාදය තුළ මිනිසාගේ පුද්ගලික ස්වාධීනත්වය නැති වේය යන කාරණය ඔහු තදින් විශ්වාස කළේ ය.

''දැන් බලන්න අපේ ලංකාවේ ළමයි රුසියාවෙ ඉගෙන ගන්නවා.. ඒ ළමයි ලංකාවට එවන ලියුම් පවා කඩලා බලලා කියවලා නැවත අලවලා තමයි මෙහාට එවන්නෙ..'' වරක් ඔහු මා සමග කී හැටි මතකය. කොමියුනිස්ට්වාදය පිළිබඳ ඉතා ඉහළ දැනීමක් තිබූ අපේ තාත්තා සමග ඔහු වරු ගණන් වාද විවාද කළේ ය.

මේ යුගය වන විට ජනතා විමුක්ති පෙරමුණ නැවත හිස ඔසවමින් සිටියේ ය. සිරිනිමල් ගේ කොමියුනිස්ට් විරෝධය ජවිපෙට ද එල්ල විය. දැන් කෙසේ වුවත් ඒ යුගයේ ජවිපෙ සැබෑ කොමියුනිස්ට්වාදය වෙනුවෙන් පෙනී සිටියේ ය. එනිසා සිරිනිමල්ට ජවිපෙ වහකදුරු මෙන් විය.

එක්කරා දෛවෝපගත දිනෙක සිරිනිමල් සිය ජීවිතයේ ඉරණම තීන්දු කරන තීරණයකට එළැඹුණේ ය.

''ජගත්.. මං හැමදාම ජේවීපී එකට බැණ බැණ ඉන්නවා.. මට හිතෙනවා ඒක සාධාරණ නැහැ කියලා.. ඉස්සෙල්ලා මං එයාලා මොකක්ද මේ කියන්නෙ කියන එක අහලා ඉන්න ඕනෙ.. හෙට මං ජේවීපී පක්ෂ කාර්යාලයකට ගිහිල්ලා ඒ අය එක්ක කතා කරනවා.. ඊට පස්සෙ මට පුලුවන් වඩා හොඳට ඒ අය විවේචනය කරන්න..'' ඔහු මට කීවේ ය.

දින දෙකකට පමණ පසු සිරිනිමල් මා හමුවන්නට එන විට ඔහු සම්පූර්ණයෙන්ම වෙනස් පුද්ගලයකු බවට පත්ව සිටියේ ය. ඔහු සමඟින් සාකච්ඡා කළ ජවිපෙ කාඩර්වරයා නියම ආකාරයට කොක්ක ගසා තිබුණි.

''කොමියුනිස්වාදය ගැනත් ජේවීපී එක ගැනත් මං දරපු මතවාද ඔක්කොම මට වෙනස් කරගන්න වුණා ජගත්.. ඒ අය හැම දේම මට හොඳට පැහැදිලි කළා..'' සිරිනිමල් කීවේය.

ඔහු බොහෝ ඉක්මණින් ජවිපෙ පන්ති පහටම සහභාගි වුණේ ය. රැකියාවෙන් ඉවත් වුණේ ය. පෙම්වතිය අමතක කළේ ය.

''මගේ පුද්ගලික අවශ්‍යතා නිසා මගේ ගමන නවත්තන්න බැහැ ජගත්.. මං එයාට ඒක තේරුම් කරල දුන්නා..'' ඔහු කිවේ ය.

සිරිනිමල් ජවිපෙ පූර්ණකාලිකයකු බවට පත් විය. රහසිගත කඳවුරු වලට සහභාගිවූයේ ය. සිය තරුණ ජීවිතයම පක්ෂය වෙනුවෙන් කැප කළේ ය. ඉගැන්වීමේ අපූරු සමත්කමක් පෙන්වූ ඔහු ඉතා ඉක්මණින්ම ජවිපෙ අධ්‍යාපන අංශයට එක් කෙරුණි.

1983 දී ජවිපෙ තහනම් වන විට ඔහු ද මම ද එක්තරා පුද්ගලික ටියුටරියක උගන්වමින් සිටියෙමු. පක්ෂ තහනමින් පසු ඔහු ටියුටරියට පැමිණීම ද නැවැත්තුවේ ය. ඒ වන විට ජවිපෙ විනාශයේ මාවත තෝරා ගෙන තිබුණි.

ජවිපෙට එරෙහි සංහාරය ඇරඹෙන විට ඔහුගේ පවුල ද එයින් බැට කෑවේ ය. ඔවුහු සැඟවුණ හ.

සිරිනිමල් ඉඳහිට දවසක රහසේ ම අපේ නිවසට ආවේ ය.

''අම්මේ බත් ටිකක් කමු ද..? දවස් ගාණකින් කෑවෙ නැහැ..'' ඔහු කියයි. අම්මා ඔහුට බත් බෙදා දෙයි. ජවිපෙ ගෙන යන අත්තනෝමතික වැඩ පිළිවෙල ගැන තාත්තා නගන ප්‍රශ්න වලට ද ඔහු පිළිතුරු දෙයි.

ජවිපෙට එරෙහි ප්‍රහාර උත්සන්න වන විට ඔහුගේ ගමන ද අඩු විය. ඔහු අවසන් වරට අපේ නිවසට ආ දවස මට තවමත් මතක ය.

''මං ආයෙ එන්නෙ නෑ ජගත්..'' ඔහු අවසන් වරට කීවේ ය. ''.. මං නිසා ඔයාලටත් කරදර වෙයි..''

කිලිටු කමිසයෙන් හා කලිසමෙන් සැරසී පතුල් ගෙවී ගිය කබල් සපත්තු දෙක අද්දවමින් ඔහු අපේ නිවසේ සිට මහ පාර දෙසට ගාටමින් යන අයුරු ඇස්වල කඳුලු පුරවාගෙන මම ගේට්ටුව අසළ සිට බලා සිටියෙමි.

සිරිනිමල් අතුරුදන් වූ දහසක් තරුණයන් අතරට එක් විය.

හරි හෝ වේවා වැරදි හෝ වේවා තමා ඇදහූ දේශපාලන දහම වෙනුවෙන් මගේ පැරණි ම මිත්‍රයා ජීවිතයෙන්ම වන්දි ගෙව්වේ ය.

පසු වදනක්

ඔහු ලියූ කවියක් මගෙ පොත් අතර බොහෝ කලක් සැඟව තිබී මට හමු වූයේ මා මගේ පළමු කාව්‍ය සංග්‍රහය සඳහා කවි ලියමින් සිටි සමයේ දී ය.

කුමරියක වෙලා ඇය<br>
සඳ දිලුණ මේ රැයේ<br>
මගේ සිතුවිලි ගොමුව<br>
අතර මැද සැඟවුණෝ

එසේ ඇරඹුන ඒ කවි පෙළ ඔහු ලියා තිබුණේ සිය පෙම්වතිය වෙනුවෙනි. මගේ 'සිසිරයේ පිපුණ මල' කාව්‍ය සංග්‍රහයේ මම සිරිනිමල් වෙනුවෙන් ''අතුරුදන් වූ මිත්‍රයා'' නමින් කවි පෙළක් ලිව්වෙමි.

අධිකරණ අමාත්‍යංශයේ ලේකම්වරියක ලෙස සේවය කළ මගේ නැන්දා මගේ කවි පොතක් ඇගේ කාර්යාලයට ගෙන ගොස් තිබුණි.

''හරි වැඩේනෙ පුතා වුණේ.. පුතාගෙ කවි පොත කියෙව්වා විතරයි ඔෆිස් එකේ ගෑනු ළමයෙක් ඉකි ගගහා අඬන්න පටන් ගත්තා..'' නැන්දා මා සමඟ කීවා ය. ''මං ඒ ළමයා මගේ කාමරයට එක්කගෙන ගිහින් ඇහුවා ඇයි දුව අඬන්නෙ කියලා.. 'මැඩම්.. මේ කවියේ ලියැවිලා තියෙන්නෙ මගේ අයියා ගැන' කියලා ඒ ළමයා කිව්වා..''

ඒ සිරිනිමල් ගේ නැගණිය ද නැත්නම් ජවිපෙ වෙනුවෙන් දිවි පිදූ වෙනත් තරුණයකු ගේ නැගණියක දැයි කියන්නට අදටත් මට නොහැකි ය.

SRI LUCK AUTO P/L

Palitha (Pali)
Licenced Vehicle Tester
(RWC)



VACC

Tel 9769 1617
Mob 0425 852 720
Fact 3/32 Cambria Rd
Keysborough Vic 3173

ඔබේ වාහනයේ සියළු කාර්මික අවශ්‍යතා සඳහා දස වසරක අැප කැපවීම

Complete Service for
Clutches
Brakes
Tune Ups
All Makes
All Models
Computer Fault Diagnosis




SRI LUCK AUTO P/L